දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: DIE/OM/CIR/2017/01          දිනය: 2017.11. 20

සියලුම ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල ප්‍රධානීන් වෙත,

## ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල හරහා ගමන් බලපත් අයදුම් කරන අයදුම්කරුවන්ගෙන් ජෛවමිතික දත්ත ලබා ගැනීම.

01. 2015 අංක 07 දරණ පනතින් සංශෝධිත 1948 අංක 20 දරණ ශ්‍රී ලංකා ආගාමික හා විගාමික පනතෙන් විධිවිධාන සලසා ඇති පරිදි ශ්‍රී ලංකාවේදී විදේශ ගමන් බලපත් අයදුම් කරන අයදුම්කරුවන්ගෙන් ජෛවමිතික දත්ත (ඇඟිලිසලකුණු හා මුහුණෙහි අංකිත ඡායාරූපයක්) අනිවාර්යයෙන් ලබා ගැනීමේ ක්‍රමවේදය 2015 අගෝස්තු 15 වන දින සිට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලදී.

02. 2018 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත සඳහන් ක්‍රමවේදය ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල හරහා ගමන් බලපත්‍රයක් අයදුම් කරන අයදුම්කරුවන් සඳහා ද ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී.ඒ අනුව 2018 ජනවාරි මස 01 දින හෝ ඊට පසුව ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල හරහා ශ්‍රී ලාංකීක ගමන් බලපත්‍රයක් අයදුම්කර ස්වකීය ගමන් බලපත්‍රය ලබා ගැනීමෙන් පසු ශ්‍රී ලංකාවට පැමිණෙන පළමු අවස්ථාවේදී ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත පැමිණ සිය ජෛවමිතික දත්ත (ඇඟිලි සලකුණු) ලබා දීම අනිවාර්ය වේ. ශ්‍රී ලංකාවෙන් නැවත පිටත්ව යාමට අවසර දෙනු ලබන්නේ මෙම අවශ්‍යතාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පමණි. මෙය අදාළ වන්නේ වයස අවුරුදු 16-60 දක්වා වයස් සීමාව තුළ ගමන් බලපත් ලබා ගත් අයදුම්කරුවන් සඳහා පමණි.

03. ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවලදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග -

(අ) ඉහත 2 හි සඳහන් අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා විදේශ ගමන් බලපත් අයදුම්පත්‍රය (Kආකෘතිය) සංශෝධනය කරන ලදී. මෙම අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ ප්‍රකාශය අඩංගු කොටසෙහි (20 කොටස) අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය. අයදුම්කරුගේ ප්‍රකාශය අඩංගු කොටසෙහි අයදුම්කරුගේ අත්සන රහිතව කිසිදු අයදුම්පත්‍රයක් භාර නොගත යුතුය. සංශෝධිත ගමන් බලපත් සඳහා අයදුම්පත්‍රය (Kආකෘතිය) ඇමුණුම 'A' වශයෙන් මෙයට අමුණා ඇත. (මෙම අයදුම් පත්‍රය දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා බාගත කළ හැකිය.)

(ආ) ඇඟිලි සළකුණු ලබාදීම සම්බන්ධයෙන් විශේෂ උපදෙස් පත්‍රිකාවක් සෑම අයදුම්කරුවකු වෙතම නිකුත් කළ යුතුය. මෙමඋපදෙස් පත්‍රිකාව ඇමුණුම 'B' වශයෙන් මෙයට අමුණා ඇත.

(ඇ)මේ අනුව, විදේශ දූත මණ්ඩල සිය වෙබ් අඩවි යාවත්කාලීන කිරීම නිර්දේශ කරනු ලැබේ.

(ඈ) ගමන් බලපත් සඳහා සංශෝධිත අයදුම්පත් (Kආකෘතිය) සියලුම ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලවලට දෙපාර්තමේන්තුව මගින් සපයනු ලැබේ.